#mediaethicsSL #SinhalaPress #lka #Divaina

පුවත්පතක ප්‍රවෘත්ති වාර්තාවක් හෝ ලිපියක් ඉදිරිපත් කිරීමේදී, එහි සිරස්තලය පාඨක ආකර්ෂණයට ලක්වන අයුරින්, නිර්මාණශීලීව යෙදීමට ඇති හැකියාව සහ අයිතිය සම්බන්ධයෙන් කිසිසේත්ම විවාදයක් නොමැත. එනමුත් සිරස්තල යෙදීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ, අන්තර්ගතයේ කියැවෙන පුවතට සම්බන්ධ වන ලෙසින් සහ එහි නිරවද්‍යභාවය රැකෙන ලෙසින් සිරස්තල යෙදිය යුතු වීමයි. මන්දයත්, සිරස්තලය තුළින් පුවතේ නිරවද්‍යභාවයට හානි වීමක් හෝ පුවත විකෘති වීමක් හෝ පාඨකයින් නොමඟ යැවීමක් සිදුවන්නේ නම් එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් වන බැවිනි.

මේ සඳහා උදාහරණයක් ලෙසින් දිවයින පුවත්පතේ පළවූ පහත ප්‍රවෘත්තිය ගත හැක. මෙහි අන්තර්ගතයේ පැවසෙන්නේ රාජ්‍ය අමාත්‍ය රන්ජන් රාමනායක මහතා එම ධූරයෙන් ඉතා ඉක්මනින් ඉවත් කෙරෙනු ඇතැයි ආණ්ඩුවේ ප්‍රකාශකයෙකු පැවසූ බවයි. මෙයින් රන්ජන් රාමනායක මහතා ධූරයෙන් ඉවත් කෙරී ඇති බවක් නොහැඟවේ. එනමුත් 'ඇමැතිකමෙන් රන්ජන් දොට්ට!' යනුවෙන් යෙදී ඇති සිරස්තලයෙන් හැඟවෙන්නේ මෙය සිදුවී ඇති බව නොවේද? මෙම සිරස්තලය ප්‍රශ්නාර්ථයක් සමගින් යෙදුණේ නම් එම ගැටළුව ඇති නොවනු ඇත. මෙම පුවත පළ වී සතියකට වැඩි කාලයක් ගතවී ඇති බවද මෙහිදී අවධානයට පාත්‍ර විය යුතුය. අවසාන වශයෙන්, අන්තර්ගතයේ ඇති කරුණු කාරණාවන්ට වෙනස් අදහසක් ඉදිරිපත් වන ලෙසින් මෙසේ සිරස්තල යෙදීමද මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් බව අපි නැවත නැවතත් සිහිපත් කරමු.